# මැදිරිගිරිය වටදාගයෙහි වාස්තුවිද්‍යාත්මක වැදගත්කම

එච්.ආර්.නීලකා සඳමාලී ජයලත්[39]

---

උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මණ්ඩලගිරිය පිහිටා ඇත. එහි මැදිරිගිරිය වටදාගෙය අධ්‍යයන කෙෂ්ත්‍රය වශයෙන් තෝරා ගන්නා ලදි. මැදිරිගිරිය වටදාගෙයෙහි වාස්තුවිද්‍යාත්මක වැදගත්කම මෙහි දී අධ්‍යයනයට ලක් කරන ලදී. මෙම ස්ථානය පිළිබඳ මූල් ම සඳහන කණිට්ඨතිස්ස රජ කාලයට අයත් වන අතර ස්තූපය තුළ තිබී හමු වූ බ්‍රාහ්මී අක්ෂර අනුව මෙම ස්තූපය ආදිත ම යුගයේ ස්තූපයක් බව හෙළිවේ. වටදාගෙයෙහි ස්තූපය දෙවැනි වරට 7 වැනි සියවසේදී 4 වැනි අග්ගබෝධි රජු ප්‍රතිසංස්කරණය කරවා ඇති බව හෙළිවේ.මිනිසා විසින් ගොඩනගන ලද ආරාම, සුසාන, ස්මාරක, නිවාස යනාදිය වාස්තුවිද්‍යා ගණයට අයත් වේ. මෙම වාස්තුවිද්‍යාත්මක දෑ අධ්‍යයනය මගින් සමකාලීන මානවයාගේ සංවර්ධන, තාක්ෂණ, භෞතික පරිසර කලාව, චින්තනය, හඳුනාගත හැකිය.  අධ්‍යයන කෙෂ්ත්‍රය හඳුනාගැනීම සඳහා සාහිත්‍ය කෘති, ජනශ්‍රැති, ජන කතා ඉවහල් විය. සමකාලීන මානවයාගේ කලාවේ ස්වරූපය වටදාගෙය තුළින් පිළිඹිබු වේ. මූලිකවම සඳකඩ පහණ, ප්‍රධාන දොරටු උළුවස්ස, මුරගල්, කොරවක් ගල්, හිඳි පිළිම, හිටි පිළිම, පුන්කළස්, ගල් කණු, බොරදම් පිළිබඳ අණාවරණය කෙරේ. තාක්ෂණික ඥානය අනුව ගොඩනැගිලි ඉදිකිරිමත් ඒ සඳහා යාබද ගොඩනැගිලිවල බලපෑමත් අනාවරණය කෙරේ. මැදිරිගිරිය වටදාගයෙහි වාස්තුවිද්‍යාත්මක අගය පිළිබඳ විමර්ශනයේ දී පියගැටපෙළ, ගඩොල් බැමි, දොරටු, නිර්මාණය සඳහා භාවිත අමුද්‍රව්‍ය මගින් එහි වාස්තුවිද්‍යාත්මක විද්‍යාත්මක නිමැවුම තුළින් එහි ඇති න්‍යායන් ද ඉස්මතු කර ඇත. මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් වටදාගයෙහි ඇති වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ හඳුනාගැනීම, එය ආරක්ෂා කිරිම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ විමර්ශනය කිරිම, මෙම පර්යේෂණය ඇසුරින් සිදුකර තිබේ.

ප්‍රමුඛ පදඃ වටදාගෙය, වාස්තුවිද්‍යාව, තාක්ෂණය

---

[39] පුරාවිද්‍යා හා උරුම කළමණාකරණඅධ්‍යයනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.